පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# තෙවැනි වාර පරීක්ෂණය - 2023

විෂයය :- ඉතිහාසය I

පාසලේ නම : ......................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 01

**උපදෙස්**

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**
- **එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.**

**1.** මහාවංශය රචනා කිරීමට පෙර ලියවී තිබූ සාහිත්‍ය ග්‍රන්ථය මින් කුමක්ද?

(1) ථූපවංශය (2) ධාතුවංශය (3) බෝධිවංශය (4) සීහලට්ඨකථා වංශය

**2.** ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය සමය දක්වා දේශපාලන තොරතුරු ඇතුළත් සාහිත්‍ය ග්‍රන්ථය මින් කුමක්ද?

(1) නිකාය සංග්‍රහය (2) රාජාවලිය (3) පූජාවලිය (4) සද්ධර්මාලංකාරය

**3.** "බෞද්ධ රාජධානි පිළිබඳ විස්තරය" නමින් ශ්‍රී ලංකාව පිළිබඳව ද තොරතුරු ඇතුළත් කරමින් ග්‍රන්ථයක් රචනා කළේ කවුරුන්ද?

(1) පාහියන් හිමි (2) රිබෙයිරෝ (3) පිලිප්පස් බැල්දියස් (4) ඉබන් බතූතා

**4.** ක්‍රි.ව. දොළොස්වැනි සියවසේ මෙරට ඉතිහාසය හැදෑරීමේදී වැදගත් වන අභිලේඛනය වූයේ,

(1) වල්ලිපුරම් රන්පත (2) බදුලු ටැම් ලිපිය (3) පනාකඩුව තඹ සන්නස (4) මිහින්තලා පුවරු ලිපිය

**5.** කාලනිර්ණයන් පදනම් කර ගනිමින් දැනට වසර 125000ක් තරම් පැරණි කාලයකට අයත් මෙරට ප්‍රාග් ඓතිහාසික ස්ථානය වූයේ,

(1) බූන්දල (2) මිනිහාගල්කන්ද (3) පතිරාජවෙල (4) උඩමළල

**6.** කලා ඔය නිම්නය කේන්ද්‍ර කර ගනිමින් ජනාවාස වී ඇති පූර්ව ඓතිහාසික ස්ථානය මින් කුමක්ද?

(1) හල්දුම්මුල්ල (2) රංචාමඩම (3) බෙරගල (4) පොම්පරිප්පුව

**7.** මෙරට මුල් ඓතිහාසික ජනාවාස ගංගා නිම්නයෙන් පිටත ප්‍රදේශ වල මුලින්ම ව්‍යාප්ත වූ බවට සාක්ෂි ලැබෙන ගංගා නිම්නය වන්නේ,

(1) කිරිඳි ඔය (2) මල්වතු ඔය (3) දැදුරු ඔය (4) යාන් ඔය

**8.** "ඇඹුල් අඹේ" නම් සෙල්ලිපියේ ප්‍රාදේශීය පාලකයා හඳුන්වා ඇත්තේ මින් කුමන නමින්ද?

(1) දුහතර රජ (2) පොචනි රජ (3) මහා සම්මත (4) තොට බොජක

**9.** ක්‍රි.පූ. 3 වන සියවස වන විට ඉන්දියන් සාගර කලාපයේ වෙළෙඳාම වර්ධනය වීම නිසා මෙරට දේශපාලන බලය වඩාත් හොඳින් මධ්‍යගත කරගත් රජු,

(1) පණ්ඩුකාභය (2) දේවානම්පියතිස්ස (3) දුටුගැමුණු (4) වසභ

**10.** "කාලිංග චක්‍රවර්ති" නම් රාජත්ව සංකල්පය භාවිත කළේ කුමන රජතුමාද?

(1) මහසෙන් රජු (2) පළමු කාශ්‍යප රජු (3) නිශ්ශංකමල්ල රජු (4) කාලිග මාඝ

**11.** පැරණි රාජ්‍ය තන්ත්‍රය තුළ "නගර ගුතික" යන නමින් හැඳින්වූයේ,

(1) නාගරික වාස්තු විද්‍යාඥයා ය (2) සෙන්පතිවරයා ය

(3) වෙළෙඳ කටයුතු භාර ප්‍රධානියා ය (4) නගර පරිපාලක ය

**12.** පැරණි සමාජයේ තිබූ වෘත්තීන් අතරින් "වොහාර" නමින් හඳුන්වා ඇත්තේ කවුරුන්ද?

(1) නීතිවිශාරදයෝ (2) වෛද්‍යවරු (3) වෙළෙඳුන් (4) ගුරුවරුන්

**13.** මහා විහාරයේ වැඩ වාසය කරමින් ත්‍රිපිටකය විස්තරාත්මකව අටුවා ලෙස සකස් කළේ මින් කුමන භික්ෂුවද?

(1) බුද්ධඝෝෂ හිමි (2) පාහියං හිමි (3) හියුං සියැං හිමි (4) ඉට්සිං හිමි

**14.** ප්‍රථම වරට දකුණු ඉන්දීය කුලී හමුදාවකගේ සහය ලබා ගනිමින් තම රාජත්වය තහවුරු කරගත් රජු කවුරුන්ද?

(1) අභයනාග (2) පළමුවන විජයබාහු (3) ඉළනාග (4) පළමුවන මුගලන්

**15.** පැරණි විද්‍යාත්මක දැනුම හා තාක්ෂණය භාවිතයේ පරිණති අවස්ථාවක් නිරූපණය වන්නේ මින් කුමන ක්ෂේත්‍රය තුළින්ද?

(1) මැටි ඔරු සුසාන ඉදිකිරීම (2) නිවාස ඉදිකිරීම

(3) මැටි බඳුන් නිපදවීම (4) නගර හා උද්‍යාන නිර්මාණය

- පහත A සිට E දක්වා ප්‍රකාශ හොඳින් කියවා **16** හා **17** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A) වන්න පාලකයෙකුව සිට දඹදෙණියේ රජකමට පත්වීම

B) කාලිංග මාඝ පරාජයට පත් කිරීම

C) කව්සිළුමිණ නම් සාහිත්‍ය ග්‍රන්ථය රචනා කිරීම

D) කාලිංගරායර නම් සෙන්පතියාගේ ආක්‍රමණයට මුහුණ දීම

E) ඊජිප්තුවේ සුල්තාන් රජු සමඟ වාණිජ සබඳතා පවත්වා ගැනීම

**16.** දෙවැනි පරාක්‍රමබාහු රජු සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

**17.** යාපහුව රාජධානියේ ඓතිහාසිකත්වය හා බැඳෙන තොරතුරු දැක්වෙන පිළිතුර කුමක්ද?

(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

**18.** ගම්පොළ රාජධානි සමයේ රාජත්වයේ උරුමය හිමිවූයේ,

(1) රජුගේ සහෝදරියකගේ පුතෙකුට යි

(2) පියාගෙන් පසු වැඩිමහල් පුතාට යි

(3) සහෝදරයාගෙන් පසු සහෝදරයාට යි

(4) රජ බිසවගේ වැඩිමහල් සහෝදරයාට යි

**19.** උඩරට පාලන සංවිධානය තුළ බද්දේ සංවිධානයට අයත් "රදා බද්ද" නමින් හැඳින්වූයේ කුමන කාර්යකින් අය කළ බද්දක් ද?

(1) ප්‍රවාහන කටයුතු (2) ඇතුන් ඇල්ලීම (3) රෙදි සේදීම (4) රෙදි විවීම

**20.** මහනුවර රාජධානියේ ඉඩම් අයිතිය හා භුක්තිය පදනම් කරගනිමින් "නින්දගම්" යනුවෙන් හැඳින්වූයේ,

(1) රදළ ප්‍රධානීන්ගේ සේවය වෙනුවෙන් ලබා දුන් ඉඩම් ය

(2) ගම් වැසියන් පරම්පරාවෙන් භුක්ති විඳි ඉඩම් ය

(3) රජවාසල ප්‍රයෝජනය සඳහා වෙන්වූ ඉඩම් ය

(4) දේවාල සඳහා පූජාකළ ඉඩම් ය

**21.** යුරෝපා පුනරුද සමයේ නව සොයාගැනීම් කිහිපයක් හා නිර්මාණ කිහිපයක් සිදුකළ පුද්ගලයන් කිහිප දෙනෙකු I තීරුවේ ද ඔවුන්ගේ සොයාගැනීම් හා නිර්මාණ II තීරුවේ ද දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක්ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. නිකලස් කොපර්නිකස් | A දේව දරුවෝ නම් චිත්‍රය |
| 2. පෙට්රාක් | B පෘථිවිය ගෝලාකාර බව |
| 3. රෆායල් | C ග්‍රහවස්තු සූර්යා වටා ඉලිප්සාකාරව ගමන් කරන බව |
| 4. ජොහැන්නස් කෙප්ලර් | D ලෝරාට සැහැලි කවි |

(1) A,B,C හා D (2) D,C,B හා A (3) A,B,D හා C (4) B,D,A හා D

**22.** දේශගවේෂණ කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීම නිසා "නාවික හෙන්රි" නමින් ප්‍රසිද්ධියට පත් රජු කුමන රටේ පාලකයාද?

(1) ස්පාඤ්ඤය (2) පෘතුගාලය (3) ප්‍රංශය (4) ඕලන්දය

**23.** සීතාවක රාජධානිය බිඳ වැටීම හා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) උඩරට ජනතාවගේ සහය රජුට හිමි වීම

(2) I විමලධර්මසූරිය රජුගේ රණකාමීත්වය

(3) II රාජසිංහ රජුගෙන් පසු නිසි උරුමකරුවෙක් නොසිටීම

(4) සීතාවක රජවරු නිරන්තර යුද්ධයන්ට යොමුවීම

**24.** පහත සඳහන් ඓතිහාසික සිදුවීම් කාලානුරූපීව පෙළගැස්වූ විට නිවැරදි පිළිතුර වන්නේ.

A) විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට කැඩීයාම

B) වැලිවිට සරණංකර හිමිට සංඝරාජ තනතුර පිරිනැමීම

C) ලන්දේසීන් සමග ගිවිසුමක් ඇතිකර ගනිමින් පෘතුගීසීන් මෙරටින් පලවා හැරීම

D) කෝට්ටේ බල පරාක්‍රමයෙන් නිදහස් කර ගනිමින් ප්‍රථම වරට උඩරට ස්වාධීන රාජධානියක් ලෙස ගොඩනැගීම

(1) A,B,C හා D (2) C,D,B හා A (3) D,B,A හා C (4) D,A,C, හා B

**25.** B අක්ෂරයෙන් දැක්වෙන ඓතිහාසික සිදුවීම හා සම්බන්ධ රජතුමා කවුරුන්ද?

(1) ශ්‍රී විජය රාජසිංහ (2) කීර්ති ශ්‍රී රාජසිංහ (3) රාජාධිරාජසිංහ (4) ශ්‍රී වික්‍රම රාජසිංහ

**26.** කාර්මික විප්ලවය සමයේ ආකර වල ජල නල මගින් ඉවත් කිරීමට හා වාතය කෘතීම ලෙස සිසිල් කිරීමේ කාර්ය සඳහා වාෂ්ප එංජිම නිර්මාණය කළේ

(1) තෝමස් නිව්කොමන් ය(2) ජේම්ස් වොට් ය (3) හම්ප්‍රි ඩේවි ය (4) ඒබ්‍රහම් ඩර්බි ය

**27.** ක්‍රි.ව. 19 වන සියවසේ මුල් භාගයේදී කාර්මික විප්ලවය ව්‍යාප්ත නොවුන යුරෝපා රටක් වූයේ මින් කුමක්ද?

(1) ප්‍රංශය (2) ඔස්ට්‍රියාව (3) ප්‍රශියාව (4) ස්පාඤ්ඤය

**28.** කාර්මික විප්ලවය නිසා ඇතිවූ ආර්ථික බලපෑමක් නොවන්නේ,

(1) ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම (2) වැටුප මත සේවය කරන කම්කරු පිරිසක් පිහි වීම

(3) සමාජවාදය වැනි සංකල්ප ප්‍රචලිත වීම (4) බද්ද ව්‍යාපාර සමාගම් බිහිවීම

**29.** ඉංග්‍රීසීන් විසින් පෙරදිග පිහිටවූ වෙළඳ මධ්‍යස්ථානයක් නොවන්නේ,

(1) මදුරාසිය (2) මුම්බායි (3) බතාවිය (4) කල්කටා

**30.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් රොබට් බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා හා සම්බන්ධ ප්‍රකාශ දැක්වෙන පිළිතුරු මොනවාද?

A) ප්‍රථමවරට උඩරට ආක්‍රමණය කිරීම

B) මුත්තුසාමි කුමරු උඩරට රජු වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

C) රදළයින් සමග උඩරට ගිවිසුම අත්සන් කිරීම

D) රජුට හා ඔවුන්ගේ ඥාතීන්ට උඩරට සිහසුනේ අයිතිය අහෝසි කිරීම

(1) C හා D (2) C හා A (3) A හා B (4) A හා D

**31.** 1818 ප්‍රථම නිදහස් සටනට ආසන්නතම හේතුව වූයේ මින් කුමක්ද?

(1) ඉංග්‍රීසි ආණ්ඩුව හජ්ජි මරික්කාර් මඩිගේ මොහන්දිරම් ලෙස පත් කිරීම

(2) ඉංග්‍රීසීන් විසින් බුදු දහම නොසලකා හැරීම

(3) විජාතික ආධිපත්‍යයට උඩරටියන්ට යටත් වීමට සිදු වීම

(4) රජෙකු නොමැති වීම නිසා උඩරට ජනතාව තුළ සිත් තැවුලක් ඇති වීම

**32.** 1848 දී ටොරින්ටන් සාමිවරයා විසින් පැනවූ බදු වර්ගයක් වූයේ මින් කුමක්ද?

(1) පොල්ගස් බද්ද (2) ඇග බද්ද (3) රා අරක්කු බද්ද (4) දුම්කොළ බද්ද

**33.** කොළඹ මධ්‍යස්ථානය කර ගනිමින් කතෝලික ආගම ප්‍රචාරය කළ මිෂනාරි සමාගම කුමක්ද?

(1) ලන්ඩන් (2) ඇමරිකන් (3) චර්ච් (4) බැප්ටිස්ට්

**34.** "ලංකා සංගමය" නමින් සංවිධානයක් පිහිටුවමින් කෝල්බෲක් ප්‍රතිසංස්කරණ වලට එරෙහිව උද්ඝෝෂණ ව්‍යාපාරයක් ගෙන ගියේ,

(1) ජේම්ස් පීරිස් ය (2) ජෝර්ජ් වෝල්ග් ය (3) ඩී.බී.ජයතිලක ය (4) පොන්නම්බලම් අරුනාචලම් ය

- පහත A සිට D දක්වා ඇති තොරතුරු ඇසුරින් 35 සහ 36 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A) ලංකාව නමින් හැඳින්වූ රට "ශ්‍රී ලංකාව" නමින් හැඳින්වීම

B) නාමික විධායක ජනපති තනතුර ඇති කිරීම

C) අභියාචනාධිකරණය ස්ථාපිත කිරීම

D) සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාත්මක කිරීම

**35.** 1972 ව්‍යවස්ථාව සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?

(1) A හා B (2) A හා D (3) B හා D (4) C හා D

**36.** 1972 ව්‍යවස්ථාව සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?

(1) A හා B (2) A හා D (3) B හා D (4) C හා D

- පහත A හා B ප්‍රකාශ ඇසුරින් **37** ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.

A) නිදහස, සමානාත්මතාව හා සහෝදරත්වය

B) ස්ටේට්ස් ජෙනරල් සභාව නොකැඳවීම

**37.** ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන්,

(1) A හා B සත්‍ය වේ (2) A හා B අසත්‍ය වේ

(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ

- පහත A,B,C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර **38** සිට **40** දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| (A ) | 1. දෙවන ලෝක මහා සංග්‍රාමය<br>2. වර්සෙල්ස් ගිවිසුම | (B ) | 1. ඔටෝවොන් බිස්මාර්ක්<br>2. එක්සත් ජර්මනිය |
| (C ) | 1. පර්ල් වරායට පහර දීම<br>2. නිරවි යුධ සමය | (D ) | 1. ආර්ථික හා සමාජීය මණ්ඩලය<br>2. ලෝක සෞඛ්‍ය සංවිධානය |

**38.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධයක් නොදැක්වෙන යුගලය කුමක්ද?

(1) A (2) B (3) C (4) D

**39.** පළමුවැන්න ඇතිවීමට දෙවැන්න හේතු වූ බව දැක්වෙන යුගලය කුමක්ද?

(1) A (2) B (3) C (4) D

**40.** දෙවැන්න බිහි වූයේ පළමුවැන්නේ ප්‍රතිඵලයක් ලෙස බව දැක්වෙන යුගලය කුමක්ද?

(1) A (2) B (3) C (4) D

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# තෙවැනි වාර පරීක්ෂණය 2023

විෂයය :- ඉතිහාසය II

පාසලේ නම : ....................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය : පැය තුනයි

උපදෙස්

- **I** කොටසේ ප්‍රශ්න අංක 1 **අනිවාර්ය වේ.**
- **II** කොටසින් ප්‍රශ්න **හතරකට ද, III** කොටසින් **ප්‍රශ්න එකකටද** පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

## I කොටස

**01.** **(අ)** (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

නල්ලූර්, හුරුළු වැව, නිල්වලා ගඟ, යාපහුව, කතරගම, වික්ටෝරියා ජලාශය, මහාතිත්ථ, සීතාවක, හොර්ටන්තැන්න, පුත්තලම, ගිරාඳුරුකෝට්ටේ, පදවිය වැව (ලකුණු 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

කැලිකට්, තුර්කිය, තායිවානය, කොරියාව, රෝමය, මලක්කා සමුද්‍ර සන්ධිය (ලකුණු 06)

**(ආ)** (i) පහත *A,B,C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට අදාල පිළිතුරු **අනුපිළිවෙලින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - ආස්ථාන ලෙස පරිපාලන ඒකක වෙන් කොට එහි පාලනයට ඇමතිවරුන් පත් කළ රජු

*B* - දෙවැනි පරාක්‍රමබාහු රජුගේ දින චරියාව ඇතුළත් කර රචිත ග්‍රන්ථය

*C* - පුනරුද සමයේ චිත්‍ර කලා මධ්‍යස්ථානය වූ ඉතාලි නගරය

*D* - ජාතික වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධව ජනතා මතය සෘජුවම ලබා ගන්නා ඡන්ද විමසීමේ ක්‍රමය (ලකුණු 04)

(ii) පහත *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු **අනුපිළිවෙලින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

**A.**



1. A සිතුවමෙන් දැක්වෙන්නේ කුමන රජුගේ රුවද?
2. මෙම රජුගේ පාලන කටයුතු වූයේ කුමන රාජධානි සමයේද?
3. ක්‍රි.ව. 1638 දී මෙම රජු පෘතුගීසීන් පරාජයට පත්කළ ප්‍රසිද්ධ සටන කුමක්ද?
4. රජුගේ සිරකරුවෙකු ලෙස සිටිමින් මෙම සිතුවම නිර්මාණය කළ පුද්ගලයා කවුරුන්ද? (ලකුණු 04)

**B.**



1. මෙම සිතුවමින් නිරූපනය වන ඓතිහාසික සිදුවීම කුමක්ද?
2. මෙම සිදුවීමෙන් මියගිය ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරු කවුරුන්ද?
3. මෙය සිදුවූයේ කුමන රටකද?
4. මෙය කුමන ලෝක යුද්ධයේ ආසන්නතම සිදුවීමද?

(ලකුණු 04)

## II කොටස

**02.** (i) රජරට රාජධානි සමය පිළිබඳ තොරතුරු හෙළිවන ධර්ම ග්‍රන්ථ **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත *A* සිට *D* දක්වා ඇති එක් එක් ප්‍රකාශයට අදාල පිළිතුරු වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

*A.* මෙරට පැරණිතම ශිලා ලිපි හඳුන්වා ඇති නාමය.

*B.* පැරණි කාසි පිළිබඳව හදාරණ විෂය ක්ෂේත්‍රය.

*C.* ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් ග්‍රීක සාහිත්‍ය මූලාශ්‍රය.

*D.* පුරාණ කාලයේ ආගමික හා සාහිත්‍ය තොරතුරු මෙන්ම වංශකතා ලියවීම.

(පුස්කොළ පොත්, සෙල්ලිපි, බ්‍රාහ්මීය ලිපි, නාණක විද්‍යාව, ඩිමුන්ඩෝ, නැවුරාලිස් හිස්ටෝරියා) (ලකුණු 04)

(iii) මෙරට ඉතිහාසය හැදෑරීමේදී සෙල්ලිපි වලින් ලැබෙන දායකත්වය උදාහරණ **දෙකක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) සාහිත්‍ය මූලාශ්‍ර මෙරට ඉතිහාසය ගොඩනැගීමේ දී ප්‍රමුඛ වී ඇති ආකාරය උදාහරණ **තුනක්** මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

**03.** (i) පහත *A, B* හා *C* යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

*A.* අධික වර්ෂාවක් පැවති භූ අවධිය.

*B.* මැටි සහිත වැලි පසින් වැසුණු බොරළු පස් තට්ටුව.

*C.* ක්‍රි.පූ. 7000-4500 අතර පැවති අයිස් යුගය (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පහත රට තෙත් කලාපීය හා පහතරට වියලි කලාපීය ලෙන් දෙක බැගින් ලියන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ ක්‍රමවත් වූ අභිචාර විධි දක්නට ලැබුණු බවට වූ සාධක කරුණු **දෙකක්** මඟින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික ජනාවාස ව්‍යාප්තියට භෞතික සාධක පදනම් වූ ආකාරය කරුණු **තුනක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

**04.** (i) පහත $A$ $B$ හා $C$ යටතේ දැක්වෙන එක් එක් පුද්ගලයින්ගේ තනතුරු නාම සෙල්ලිපි වල සඳහන් වන ආකාරය අනුපිළිවෙලින් ලියා දක්වන්න.

$A$ . ගමක ප්‍රධානියා

$B$ . වැව් පද්ධතියක් භාර ප්‍රධානියා

$C$ . ප්‍රාදේශීය පාලනය ගෙන ගිය කාන්තා ප්‍රධානියා (ලකුණු 03)

(ii) පහත සඳහන් එක් එක් කරුණට සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි, වරහන් තුළින් තෝරා $A$ $B$ $C$ හා $D$ අනුපිළිවෙලින් ලියා දක්වන්න.

$A$ . ප්‍රථම වරට පුර සංකලපය ක්‍රියාත්මක කිරීම

$B$ . පංච කකුධ භාණ්ඩ ලබාගෙන නැවත අභිෂේකය ලැබීම

$C$ . පරුමකවරුන්ගේ සහය ලබමින් බලය මධ්‍යගත කිරීමේ පුරෝගාමියා

$D$ . චෝල ආධිපත්‍යයෙන් මෙරට මුදවා ගැනීම සඳහා කාලිංග පාණ්ඩ්‍ය රාජ්‍යයන් සමඟ විවාහ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම (ලකුණු 04)

(දේවානම්පියතිස්ස රජු, වසභ රජු, I විජයබාහු රජු, දුටුගැමුණු රජු, පණ්ඩුකාභය රජු, කාවන්තිස්ස රජු)

(iii) පුරාණ කාලයේ ග්‍රාමීය පාලනය සිදුවූ ආකාරය එහි නායකත්වය හා කාර්යයන් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(iv) රාජත්වයට පත්වන පාලකයා තම රටවැසියා වෙනුවෙන් වගකීම් සමුදායකින් බැඳී සිටිමින් පාලනය ගෙන ගිය බව කරුණු තුනකින් පැහැදිළි කරන්න. (ලකුණු 06)

**05.** (i) දෙවැනි නාගරීකරණ සමයේ මයා රටේ බිහිවූ රාජධානි තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් $ABC$ හා $D$ යටතේ දක්වා ඇති ඓතිහාසික සිද්ධීන් හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

$A$ . බෞද්ධ පූජනීය වස්තු ලබා ගැනීමේ අරමුණින් මෙරට ආක්‍රමණය කළ ජාවක රාජ්‍යයේ ආක්‍රමණිකයා

$B$ . යාපහුවට පැමිණි දළදාව පැහැරගෙන ගොස් පාණ්ඩ්‍ය රාජ්‍යයේ කුලශේකර රජුට ලබා දීම

$C$ . ආර්ය චක්‍රවර්තී පරාජයට පත් කිරීමට කෝට්ටේ බලකොටුවක් ඉදිකිරීම

$D$ . VIII වීර පරාක්‍රමබාහු නමින් කෝට්ටේ රජවීම

(ලකුණු04)

(iii) දෙවැනි නාගරීකරණ සමයේ කලාව හා ගෘහ නිර්මාණ ශිල්පයේ දක්නට ලැබෙන විශේෂතා දෙකක් උදාහරණ මගින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(iv) කෝට්ටේ යුගය මෙරට සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය වශයෙන් සැලකෙන්නේ කුමන හේතු නිසාදැයි කරුණු තුනක් මගින් පැහැදිළි කරන්න. (ලකුණු 06)

**06.** (i) පහත සඳහන් $A$ $B$ හා $C$ යටතේ ඇති එක් එක් දේශපාලන වෙනස්කම් සිදුවූයේ කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ දැයි **අනුපිළිවෙලින්** ලියා දක්වන්න.

$A$ . ප්‍රථමවරට සීමිත ඡන්ද අයිතිය ලබා දීම

$B$ . පළාත්බද නියෝජනයෙන් ප්‍රථම වරට ව්‍යවස්ථාදායකයට නියෝජිතයන් පත් කිරීම

$C$ . අග්‍රාණ්ඩුකාර ධූරය ස්ථාපිත කිරීම (ලකුණු 03)

(ii) ක්‍රි.ව 1833 ක්‍රියාත්මක කළ කෝල්බෲක් ප්‍රතිසංස්කරණයේ ආර්ථික හා පරිපාලන යෝජනා **දෙක** බැගින් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ලාංකිකයන්ට සැලකිය යුතු දේශපාලන වගකීම් පැවරූ ආණ්ඩුක්‍රමයක් යන්න කරුණු **දෙකක්** මගින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(iv) බ්‍රිතාන්‍ය පාලන සමය තුළ මෙරට ආර්ථික හා සමාජීය පරිවර්තනයන් රැසක් සිදුවූ බව කරුණු **තුනක්** ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 06)

**07.** (i) නිදහස ලැබීමට පෙර මෙරට බිහිවූ දේශපාලන පක්ෂ **තුනක්** පහත සඳහන් වරහන් තුළින් තෝරා ලියන්න.

(ලංකා සමසමාජ පක්ෂය,ශ්‍රී ලංකා නිදහස් පක්ෂය,ෆෙඩරල් පක්ෂය,ලංකා කොමියුනිස්ට් පක්ෂය,එක්සත් ජාතික පක්ෂය)

(ලකුණු 03)

(ii) 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවේ හා 1978 දෙවැනි ජනරජ ව්‍යවස්ථාවේ ලක්ෂණ දෙක බැගින් ලියන්න.

(ලකුණු 04)

(iii) නිදහසින් පසු ගතවූ දශක තුනක කාලයක් තුළ මෙරට කාර්මික ප්‍රතිපත්තියේ ඇතිවූ වෙනස්කම් දෙකක් උදාහරණ මඟින් පැහැදිළි කරන්න. (ලකුණු 05)

(iv) මහවැලි සංවර්ධන ව්‍යාපාරය බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයක් ලෙස වැදගත් වීමට තුඩුදුන් හේතු තුනක් උදාහරණ මඟින් පැහැදිළි කරන්න. (ලකුණු 06)

## III කොටස

**08.** (I) පහත විප්ලව හා බැඳුණු සටන් පාඨ A B හා C යන අනුපිළිවෙලින් ලියා දක්වන්න.

A. ඇමරිකානු නිදහස් සටන

B. ප්‍රංශ විප්ලවය

C. රුසියානු විප්ලවය

(ලකුණු 03)

(II) ඇමරිකනු මහද්වීපය තුළ ජනපද පිහිට වූ යුරෝපා ජාතීන් හතරක් නම් කරන්න.

(ලකුණු 04)

(III) සමාජවාදී දර්ශනය රුසියානු විප්ලවයත් සමඟ ආරම්භ වූ ආකාරය කරුණු දෙකකින් පැහැදිළි කරන්න.

(ලකුණු 05)

(IV) විප්ලවයට පෙර ප්‍රංශයේ පැවති රාජාණ්ඩුක්‍රමය ප්‍රංශ විප්ලවයට පදනම දැමූ බව කරුණු තුනකින් පැහැදිළි කරන්න. (ලකුණු 06)

**09.** (I) පහත *A B* හා *C* යටතේ ඇති ප්‍රශ්න වලට පිළිතුරු නිවැරදි අනුපිළිවෙලින් ලියා දක්වන්න.

*A.* පළමු ලෝක යුද්ධයෙන් පසු ජර්මනියේ පිහිටවූ ආණ්ඩුව

*B.* නට්සි විරෝධී ව්‍යාපාරයක් ආරම්භ කළ බ්‍රිතාන්‍ය අගමැති

*C.* නොබැඳි සමුළුවේ පුරෝගාමී වූ ඉන්දීය අගමැති (ලකුණු 03)

(II) පහත *A B C* හා *D* යටතේ ඇති ප්‍රශ්න වලට පිළිතුරු නිවැරදි වරහන් තුළින් තෝරා නිවැරදි අනුපිළිවෙලින් ලියා දක්වන්න.

*A.* 1919 පැරිස් සාකච්ඡා වලට සහභාගී වූ ප්‍රංශ අගමැති

*B.* වර්සෙල්ස් ගිවිසුමෙන් දැඩි දඬුවම් ලද රාජ්‍ය

*C.* එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිශේධ බලය හිමි රට


*D.* සමාජවාදී පිළිවෙතක් අනුගමනය කරමින් සූවස් ඇළ ජනසතු කළ මිසර ජනාධිපති

(අබ්දුල් ගමාල් නසාර්,ක්ලෙමන් ෂෝ,වුඩ්රෝ විල්සන්,ජර්මනිය,ඔස්ට්‍රියාව,එක්සත් රාජධානිය,මාෂල් ටිටෝ) (ලකුණු 04)

(III) හිට්ලර්ගේ මෙන්ම මුසෝලනීගේ ක්‍රියා කලාපයන් දෙවැනි ලෝක යුද්ධයට මග පෑදූ ආකාරය පැහැදිළි කරන්න. (ලකුණු 05)

(IV) දෙවැනි ලෝක යුද්ධයේ ප්‍රතිඵල, දේශපාලන ක්ෂේත්‍රය තුළ ද දක්නට ලැබෙන බව කරුණු **තුනක්** මඟින් පැහැදිළි කරන්න. (ලකුණු 06)


N


N
Europe
Africa
Indian Ocean

**පිළිතුරු**

**<u>I පත්‍රය</u>**


| | | | |
|---|---|---|---|
| (1) 4 | (11) 4 | (21) 4 | (31) 1 |
| (2) 2 | (12) 1 | (22) 2 | (32) 2 |
| (3) 1 | (13) 1 | (23) 3 | (33) 4 |
| (4) 3 | (14) 3 | (24) 4 | (34) 2 |
| (5) 3 | (15) 4 | (25) 2 | (35) 1 |
| (6) 4 | (16) 2 | (26) 1 | (36) 4 |
| (7) 1 | (17) 4 | (27) 4 | (37) 1 |
| (8) 2 | (18) 1 | (28) 3 | (38) 3 |
| (9) 2 | (19) 3 | (29) 3 | (39) 1 |
| (10) 3 | (20) 1 | (30) 1 | (40) 2 |

## I කොටස

**සැලකිය යුතුයි**

- **හිස් අවකාශයක නම් 1cm² තුල අදාල ස්ථානය ලකුණු කර ඇත්නම් නිවැරදි ස්ථානයක් සේ සලකන්න.**
- **කතරගම මැණික් ගඟට ඉහලින් හා පහළින් ඇත්නම් ලකුණු දෙන්න.**
- **සීතාවක ඔය සමීපව සීතාවක තිබිය යුතුය.**


1 (අ) (I)



**සැලකිය යුතුයි**

- දී ඇති රටවල් සේයා කිරීම අනිවාර්ය නොවන අතර අදාල රට නිවැරදිව හඳුනාගෙන ඇත්නම් ලකුණු ලබා දෙන්න.

1 (අ) (II)



I. ආදර්ශ ලංකා සිතියමේ ලකුණු කර ඇත.
II. ආදර්ශ ලෝක සිතියමේ ලකුණු කර ඇත.

(නිවැරදි පිළිතුරු 1කට එක ලකුණ බැගින් හිමිවේ)

(ලංකා සිතියම 1 × 12 = 12යි)
(ලෝක සිතියම 1 × 6 = 6යි)

(ආ)
A. වසභ
B. කඳවුරු සිරිත
C. ෆ්ලෝරන්ස්
D. ජනමත විචාරණය (ලකුණු 1 × 4 = 4යි)

II. (A)

I. II රාජසිංහ රජු

II. මහනුවර රාජධානිය/ උඩරට රාජධානිය/ උඩරට රාජ්‍ය/ කන්දෙ නුවර

III. ගන්නෝරුව සටන

IV. රොබට් නොක්ස් (ලකුණු 1 × 4 = 4යි)

(B)

I. සරයෙවෝ සිද්ධිය

II. ආර්ච් ඩියුක් ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ්/ ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් (ෆර්ඩිනන්ඩ් පමණක් තිබුණොත් පිළිතුර වැරදියි)

III. බොස්නියාවේ

IV. I ලෝක යුද්ධයේ (ලකුණු 1 × 4 = 4යි)

## II කොටස

සැලකිය යුතුයි

- ලකුණු දීමේ පටිපාටියට ප්‍රමුඛතාව දී ශිෂ්‍යයන්ගේ පිළිතුරු වලට ලකුණු ලබා දෙන්න
- ලකුණු දීමේ පටිපාටියට බාහිරව නිවැරදි කරුණක් ලියා ඇත්නම් පමණක් අදාල ලකුණු ශිෂ්‍යයාට ලබා දීමට කටයුතු කරන්න

02.

I. බෝධිවංශය, ථූපවංශය, ධාතුවංශය, පූජාවලිය, සද්ධර්මාලංකාරය (මින් 03ක් සඳහා ලකුණු 03යි)

II. A. බ්‍රාහ්මීය ලිපි B. නාණක විද්‍යාව C. ඩිමුන්ඩෝ D. පුස්කොළ පොත්

III.
I. වංශකතා වල තිබෙන තොරතුරු තහවුරු වීම

II. වංශකතා වල නිදොස් තැන් සදොස් කිරීම

III. වංශකතා වල නොමැති තොරතුරු ඇතුළත් වීම

IV. සමකාලීන වීම

V. කිසිඳු සංස්කරණයකින් තොරව මුල්ම ස්වරූපයෙන්ම තිබීම

(කරුණු 02 ට ලකුණු 2 යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි)

IV.
I. ඓතිහාසික තොරතුරු අඛණ්ඩව ලියවී තිබීම

II. කාලානුරූපීව තොරතුරු ඇතුළත් වීම

III. විවිධ අවධි වල ආර්ථික, දේශපාලන, සමාජ හා සංස්කෘතික තොරතුරු ලබා ගැනීමට හැකි වීම

IV. සාහිත්‍ය මූලාශ්‍ර තොරතුරු පුරාවිද්‍යා හා අනෙකුත් මූලාශ්‍ර වලින් සනාථ වීම

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි)

03.

(I) A. ප්ලයිස්ටොසීන භූ අවධිය

B. ඉරණමඩු සැකැස්ම

C. හොලෝසීන යුගය (ලකුණු 1 × 4 = 4යි)

(II)

- ❖ පහතරට තෙත් කලාපීය ලෙන්
  - බටදොඹලෙන/ කුරුවිට බටදොඹලෙන
  - බෙලිලෙන/ කිතුල්ගල බෙලිලෙන
  - පාහියන් ලෙන/ බුලත්සිංහල පාහියන්ලෙන
- ❖ පහතරට වියලි කලාපීය ලෙන්
  - පොතාන, අලිගල (ලකුණු 1 × 2= 2යි)

III.
(I) මැටිඔරු ආකාරයේ සුසාන ඉදිකිරීම.
උදා:- රංචාමඩම, හල්දුම්මුල්ල, බෙරගල

(II) මහා ශිලා සම්ප්‍රදායේ ශිලා මංජුසා සුසාන ඉදිකිරීම.
උදා:- ඉබ්බන්කටුව, යටිගල්පොත්ත, ගල්සොහොන්කනත්ත

(III) හරණි සුසාන නිර්මාණය.
උදා:- පොම්පරිප්පුව

(මින් කරුණු 02 ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි)

IV. (I) වාර්ෂික වර්ෂාපතනය උදා:- මිලි මීටර් 1000 - 1250

(II) පසේ ස්වභාවය උදා:- රතු දුඹුරු පස

(III) භූ විෂමතාව උදා:- තැනිතලා භූමිය

(IV) ජලවහනය උදා:- වර්ෂාපතනය, ගංගා ජලය

(V) ස්වභාවික සම්පත් වල ව්‍යාප්තිය

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි)

04.
I. A ගමික B පරුමක C පරුමකලු (ලකුණු 1 × 3 = 3යි)

II. A. පණ්ඩුකාභය රජු

B. දේවානම්පියතිස්ස රජු

C. දුටුගැමුණු රජු

D. I විජයබාහු රජු (ලකුණු 1 × 4 = 4යි)

(වරහන තුළ ඇති පිළිතුර පමණක් නිවැරදි පිළිතුර වේ)

III.

- ❖ නායකත්වය :- I ගෘහපතීන් අතරින් පත්වීම.
  II ගමික, ග්‍රාමික නමින් හැඳින්වීම.
  III ජනතා විශ්වාසය හා ප්‍රසාදය දිනාගත් අයෙකු වීම.
  IV වත්පොහොසත්කම් මත තෝරා ගැනීම.

- ❖ කාර්යයන් :- I ගමට අයත් වැව නඩත්තු කිරීම හා ජලය බෙදා හැරීම.
  II ගම්වල ආරවුල් විසඳීම.
  III ගමේ පොදු කටයුතු වලදී නායකත්වය ගැනීම.
  IV යාබද ගම් සමග සුහදව කටයුතු කිරීම.

(මින් කරුණු දෙක බැගින් විස්තර වී ඇතිනම් ලකුණු 5 යි. නායකත්වය හා කාර්යයන් දෙකටම නිවැරදි පිළිතුරු ලිවීම අත්‍යවශ්‍ය වේ)

IV. (I) රටේ ආර්ථිකය දියුණු කිරීම

(II) රටවැසියාට ආරක්ෂාව සැපයීම

(III) ජනතාවගේ ආධ්‍යාත්මය පෝෂණය කිරීම

(IV) ජනතාවගේ සමාජ සුබසාධනය ඇති කිරීම

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6යි)

05.

I. දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, කෝට්ටේ (ලකුණු 1 × 3 = 3යි)

(සීතාවක, රයිගම ලකුණු ලබා නොදෙන්න)

II. A. චන්ද්‍රභානු/ ජාවක චන්ද්‍රභානු

B. ආර්යචක්‍රවර්තී

C. නිශ්ශංක අලගක්කෝණාර/ නිශ්ශංක අලකේශ්වර

D. අම්බුළුගල කුමරු (ලකුණු 1 × 4 = 4යි)

III. (I) දකුණු ඉන්දීය ගෘහ නිර්මාණ සම්ප්‍රදායන්ගේ ආභාසය ලැබීම.
උදා :- පාණ්ඩ්‍ය, කාම්බෝජ, විජයනගර්

(II) පිළිමගෙට සම්බන්ධකොට දේවාල ඉදි කිරීම
උදා :- ගඩලාදෙණි හා ලංකාතිලක පිළිමගෙය

(III) ලී කැටයම් කලාව
උදා :- ඇම්බැක්කේ දේවාලය

(මින් කරුණු 02 ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5යි)

IV. I) රාජ්‍ය අනුග්‍රහය ලැබීම
උදා :- VI පරාක්‍රමබාහු

(II) ගිහි පැවිදි උගත් පඬිවරු සිටීම
උදා :- තොටගමුවේ ශ්‍රී රාහුල හිමි

වීදාගම මෛත්‍රී හිමි

VI පරාක්‍රමබාහු රජු

කැරගල වනරතන හිමි

නන්තුර් තුතයා

ඉරුගල්කුලතිලක හිමි

(කෝට්ටේ යුගයේ සිටි ගිහි පැවිදි උගතුන් පමණක් නිවැරදි පිළිතුරු වේ)

(III) බෞද්ධ අධ්‍යාපනික මධ්‍යස්ථාන බිහිවීම

උදා :- පැපිලියාන සුනේත්‍රාදේවී පිරිවෙන

දෙවි නුවර ඉරුගල්කුලතිලක පිරිවෙන

වීදාගම සනානන්ද පිරිවෙන

කැරගල පද්මාවතී පිරිවෙන

(කෝට්ටේ යුගයට අයත් පිරිවෙන් පමණක් නිවැරදි පිළිතුරු සේ සලකන්න)

(IV) විවිධ තේමාවන් යටතේ ග්‍රන්ථ රචනා වීම

උදා :- සංදේශ, වංශකතා, ධර්ම ග්‍රන්ථ, චරිත කතා, උපදේශ කාව්‍ය

(කෝට්ටේ යුගයේ ලියූ සාහිත්‍ය ග්‍රන්ථ පමණක් නිවැරදි පිළිතුරු සේ සලකන්න)

(මින් කරුණු 03 ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6 යි)

06.

I. A. කෝල්බෘක් කැමරන් ප්‍රතිසංස්කරණය

B. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය

C. සෝල්බරි ආණ්ඩුක්‍රමය (ලකුණු 1 × 3 = 3යි)

II.

❖ ආර්ථික

(I) අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම

(II) රජයේ වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම

(III) නව ඉඩම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම

(IV) වක්‍ර බදු ක්‍රමය (මින් කරුණු 02 ට ලකුණු 2යි)

❖ පරිපාලන

(I) ඒකීය පාලන ක්‍රමයක් ඇති කිරීම

(II) පළාත් දහසය පලාත් පහකට සීමා කිරීම

(III) ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම (මින් කරුණු 02 ට ලකුණු 2යි)

III. (I) සර්වජන ඡන්ද අයිතිය ලබා දීම

(II) විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම

(මින් කරුණු 02ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5 යි)

IV.

❖ <u>ආර්ථික වෙනස්කම්</u>

(I) අපනයන වැවිලි භෝග හඳුන්වා දීම

(II) නව රැකියා බිහිවීම

(III) ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම

(IV) යටිතල පහසුකම් දියුණු වීම

(V) ඍජු බදු ක්‍රමය වෙනුවට වක්‍ර බදු ක්‍රමය හඳුන්වා දීම

(VI) අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය අහෝසි කිරීම

(VII) නව ඉඩම් ප්‍රතිපත්තියක් ඇති කිරීම

(VIII) බැංකු ආරම්භ වීම

❖ <u>සමාජීය වෙනස්කම්</u>

(I) නව ධනපති පංතියක් බිහිවීම

(II) කම්කරු පංතියක් බිහිවීම

(III) ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම

(IV) නිවාඩු නිකේතන, සමාජශාලා බිහිවීම

(V) ජන සංයුතියට දකුණු ඉන්දීය කම්කරුවන් ඇතුළත් වීම

(මින් කරුණු 03ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6 යි)

07.

I. ලංකා සමසමාජ පක්ෂය, ලංකා කොමියුනිස්ට් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය

II.

❖ <u>1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව</u>

(I) ලංකාව "ශ්‍රී ලංකාව" නමින් හැඳින්වීම

(II) නාමික විධායක ජනාධිපති ධූරය

(III) ජාතික රාජ්‍ය සභාව

(IV) අගමැති හා අමාත්‍ය මණ්ඩලය

(V) අධිකරණ ආයතන පහකි (මින් කරුණු 02ට ලකුණු 2යි)

❖ <u>1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව</u>

(I) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජය නමින් ශ්‍රී ලංකාව හැඳින්වීම

(II) විධායක ජනාධිපති ධූරය

(III) පාර්ලිමේන්තුව

(IV) අධිකරණ ආයතන හතකි

(V) ඡන්ද විමසීමේ ක්‍රම තුනකි

(VI) ඔම්බුඩ්ස්මන්වරයා පත් කිරීම (මින් කරුණු 02ට ලකුණු 2යි)

III.(I) මහාපරිමාණ කර්මාන්ත රජයේ අනුග්‍රහයෙන් ඉදිකිරීම (උදා:- සීනි,සිමෙන්ති,යකඩ හා වානේ,තුනී ලෑලි)

(II) කාර්මික ජනපද බිහිවීම (උදා:- 1959 ඒකල, 1960 රත්මලාන)

(III) අපනයන සැකසුම් කලාප පිහිටු වීම (උදා:- 1978 කටුනායක, බියගම , කොග්ගල)

(IV) 1966 දී ප්‍රමිති කාර්යංශය පිහිටුවීම

(V) ආයාන ආදේශක ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

(VI) කුඩා කර්මාන්ත කරුවන්ට ණය පහසුකම් සැලසීම

(VII) 1978 මහ කොළඹ ආර්ථික කොමිසම පිහිටුවීම

(මින් කරුණු 02ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5 යි)

IV. (I) කෘෂිකාර්මික කටයුතු සඳහා ජල පහසුකම් ඇති කිරීම

(II) විදුලිබල නිශ්පාදනය

(III) ඉඩම් නොමැති ජනතාවට ඉඩම් ලබා දීම

(IV) ගංවතුර පාලනය

(V) මිරිදිය මසුන් බෝ කිරීම

(VI) රැකියා අවස්ථා පුළුල් කිරීම

(VII) සමාජ සුභසාධනය දියුණු කිරීම

(මින් කරුණු 03ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6 යි)

## III කොටස

08.

(I.) A. නියෝජිතයන් නැතිනම් බදුත් නැත/ නියෝජනයක් නැතිනම් බදුත් නැත

B. නිදහස, සමානාත්මතාව හා සහෝදරත්වය

C. සාමය ඉඩම් හා ආහාර/ සාමය ඉඩම් හා පාන් (ලකුණු 1 × 3 = 3යි)

(II.) (I) ස්පාඤ්ඤ/ ස්පාඤ්ඤවරු

(II) ප්‍රංශය/ ප්‍රංශවරු

(III) පෘතුගාලය/ පෘතුගීසි

(IV) බ්‍රිතාන්‍ය/ ඉංග්‍රීසි

(V) ඕලන්ද/ ලන්දේසි (ලකුණු 1 × 3 = 3යි)

(ජාතීන්ට පමණක් ලකුණු ලබා දෙන්න. රට ලියා තිබුණොත් වැරදි පිළිතුර සේ සලකන්න)

(III.) (I) රුසියාව, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුව නමින් හැඳින්වීම

(II) සමාජවාදී මූලධර්මය පිළිගැනීම

උදා:- i) පොදු අවශ්‍යතා ප්‍රමුඛ වීම

ii) සමානාත්මතාව ඇති කිරීම

iii) පංති විෂමතාව

(III) ලොව බොහෝ රටවල සමාජවාදය ව්‍යාප්ත වීම

උදා:- චීනය, කියුබාව, නැගෙනහිර ජර්මනිය

(මින් කරුණු 02ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5 යි)

IV. (I) සියලු බලතල රජු වටා කේන්ද්‍ර වීම

(II) රජවරුන්ගේ සුඛෝපභෝගී ජීවිතය

(III) වසර 175 ක් යන තෙක් ස්ටේට්ස් ජෙනරල් සභාව නොකැඳවීම

(IV) ජනතා පිළිකුලට පත් වරෙන්තු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

(V) රජුට හිතවාදී අතලොස්සක් වූ පූජක හා රදළවරුන්ගේ උපසේ අනුව කටයුතු කිරීම

(VI) 16 ලුවී රජුගේ අදූරදර්ශී ක්‍රියාමාර්ග

(VII) ප්‍රාදේශීය පාලනය දූෂිත හා අකාර්යක්ෂම වීම

(මින් කරුණු 03ට ලකුණු 3යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 6 යි)

09. (I.) A. වෛමාර් සමූහාණ්ඩුව/ වෛමාර්

B. වින්ස්ටන් චර්චිල්/ චර්චිල්

C. නේරු/ ජවහල්ලාර් නේරු

(II) A. ක්ලෙමන් ෂෝ

B. ජර්මනිය

C. එක්සත් රාජධානිය

D. අබ්දුල් ගමාල් නසාර්

(වරහන තුළ ඇති පිළිතුර පමණක්ම නිවැරදි පිළිතුර වන අතර විකල්ප නිවැරදි පිළිතුරු වැරදි පිළිතුරු වේ)

(III)

❖ <u>හිට්ලර්ගේ ක්‍රියා කලාපය</u>

(I) නට්සිවාදය ක්‍රියාත්මක කිරීම

(II) වර්සෙල්ස් ගිවිසුම කඩ කරමින් කටයුතු කිරීම

(III) S S රහස් හමුදාව හා ගෙස්ටා පෝ රහස් පොලිසිය නිර්මාණය කිරීම

(IV) යුදෙව්වන් හා කොමියුනිස්ට්වාදීන් විනාශ කිරීම

(V) රටවල් ආක්‍රමණය කිරීම - පෝලන්තය, සුඩෙටන්ලන්තය, සාර් නිම්නය, රයින්ලන්තය, ඔස්ට්‍රියාව, චෙකොස්ලෝවැකියාව

(VI) යුධමය අතින් ජර්මනිය ශක්තිමත් කිරීම

(VII) ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම

(VIII) අනිවාර්ය යුද සේවය ඇරඹීම

(IX) සිවිල් අයිතිවාසිකම් අහෝසි කිරීම/ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස අහෝසි කිරීම - උදා:- පුවත්පත් නිදහස, අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, රැස්වීම් පැවැත්වීමේ නිදහස

(X) දේශපාලන පක්ෂ තහනම් කිරීම

❖ <u>මුසෝලිනීගේ ක්‍රියා කලාපය</u>

(I) පැසිස්ට්වාදය ක්‍රියාත්මක කිරීම

(II) කළු කමිස හමුදාවක් නිර්මාණය කිරීම

(III) හිට්ලර් සමඟ එකතු වී පැසිස්ට්වාදය ව්‍යාප්ත කිරීම

(IV) ජාතීන්ගේ සංගමයෙන් ඉවත් වීම

(V) ඇබිසීනියාව ආක්‍රමණය කිරීම

(VI) යුධමය අතින් ඉතාලිය ශක්තිමත් කිරීම

(VII) දේශපාලන පක්ෂ තහනම් කිරීම

(මින් කරුණු 02ට ලකුණු 2යි. විස්තරයට ලකුණු 3යි = ලකුණු 5 යි)

(දෙදෙනාම පිළිබඳව කරුණු ලිවිය යුතුය එසේ නැතිනම් ලකුණු අඩුකර ලබා දෙන්න)

(IV)

(I) බ්‍රිතාන්‍ය හා ප්‍රංශ අධිරාජ්‍ය බිඳ වැටීම

(II) ඇමරිකා එක්සත් ජනපදය හා රුසියාව ලෝක බලවතුන් බවට පත් වීම

(III) ධනවාදී හා සමාජවාදී ලෙස කඳවුරු දෙකක් බිහිවීම

(IV) බ්‍රිතාන්‍ය හා ප්‍රංශය තුළ යටත් විජිත වලට නිදහස ලැබීම (උදා :- ශ්‍රී ලංකාව, ඉන්දියාව, චීනය)

(V) ඇමරිකා එක්සත් ජනපදය මාෂල් සැලැස්ම ක්‍රියාත්මක කිරීම

(VI) ලෝක සාමය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංගමය බිහිවීම

(පිළිතුරු දේශපාලන ක්ෂේත්‍රයට පමණක් අදාල විය යුතුය)



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න